ඩී.එස්.සේනානායක විද්‍යාලය, කොළඹ - 07.

අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016 පූර්ව පරීක්ෂණය
ආර්ථික විද්‍යාව
1 පත්‍රය

කාලය පැය 02

01. එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.
   i. ආවස්ථික පිරිවැය හැමවිටම ධන අගයකි.
   ii. අභිමතානුරූපී ප්‍රකාශ හැමවිටම සත්‍යයෙන් තොර වේ.
   iii. යථානුරූපී ප්‍රකාශයක් යම්විටක අභිමතානුරූපී ප්‍රකාශයක් විය හැකිය.
   iv. ස්ථාවර ආවස්ථික පිරිවැය න්‍යායාත්මක සමකල්පයකි.
   v. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ඕනෑම ලක්ෂයක ආර්ථික කාර්යක්ෂමතාවය පෙන්නුම් කරයි.

02. රටකට සිය විභව නිමැවුමෙන් පිටත භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කළහැකි නම් ඉන් අදහස් වන්නේ,
   i. ඉදිරි ප්‍රතිලාභ ජනනය කරගත හැකි බවයි.
   ii. විදේශ වෙළඳාමට පිවිසීමක් පවතින බවයි.
   iii. සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් නිෂ්පාදන කටයුතු වල යොදවා ඇති බවයි.
   iv. එය ළඟාවිය නොහැකි ඉලක්කයක් බවයි.
   v. සම්පත් හිඟකම පටු වී ඇති බවයි.

03. ආර්ථික පද්ධතියක සම්පත් අයිතිය යන්නෙන් ප්‍රකාශ නොවන්නේ,
   i. තමන් කැමති ලෙස බුක්ති විඳීමට ඇති අයිතියයි.
   ii. ආදායම් ඉපයීමට ඇති අයිතියයි.
   iii. නව සම්පත් සොයා ගැනීමට ඇති අයිතියයි.
   iv. සම්පත් තමන් කැමති ආකාරයට මිලදී ගැනීමේ අයිතියයි.
   v. සම්පත් තමන් කැමති විට අලෙවි කිරීමේ අයිතියයි.

04. එකඟ නොවන ප්‍රකාශය තෝරන්න.
   i. වෙළඳපොළ පිළිබඳ ආපූර්ණ තොරතුරු පාරිභෝගික ස්වාධිපත්‍යයක් සඳහා අවශ්‍ය කොන්දේසියකි.
   ii. ඒකාධිකාරී වෙළෙඳ පොළ තත්වයකදී පාරිභෝගික ස්වාධිපත්‍යය ගිලිහේ.
   iii. වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගිකයාට භාණ්ඩ අතර තේරීමට වැඩි ඉඩක් ඇත.
   iv. වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගික ස්වාධිපත්‍ය අර්ධ සත්‍යයක් සහිත ප්‍රකාශයකි.
   v. වඩා නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියකදී පාරිභෝගික ස්වාධිපත්‍යයට බාධාවක් එල්ල වේ.

05. සම්පත් බහුල සමාජයකට,
   i. එසේ නොමැති සමාජයකට වඩා වැඩි සම්පත් ප්‍රමාණයක් බුක්ති විඳිය හැක.
   ii. හිඟකම කේන්ද්‍රීය ගැටළුවක් නොවේ.
   iii. හැමවිටම නිෂ්පාදන හැකියාව මත ක්‍රියා කිරීමට හැකිවේ.
   iv. සම්පත් අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීමට අවශ්‍ය නොවේ.
   v. සැම දෙනාටම වඩාත් හොඳ ජීවන තත්වයකට මඟ පෑදේ.

06. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියට වඩා විධාන ආර්ථික පද්ධතියක.
   i. සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා වේ.
   ii. පෞද්ගලික සම්පත් අයිතිය තහවුරු වේ.
   iii. අලෙවි උපක්‍රම භාවිත වේ.
   iv. සේවා නියුක්තිය වැඩිවේ.
   v. රජයේ මැදිහත්වීම් ඉතා ඉහළ වේ.

07. සමාජ ප්‍රාග්ධනය වඩාත් හොඳින් ප්‍රකාශ වන්නේ,
i. මානව ප්‍රාග්ධනය මගිනි.
ii. සංසරණ ප්‍රාග්ධනය හා බැඳී පැවතීමෙනි
iii. වඩාත් ඉහළ ආදායම් මගිනි.
iv. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයට වැඩි අවධානය යොමු කිරීමෙනි.
v. ස්වේච්ඡා ගත සමාජ කණ්ඩායම් මගිනි.

08. වෙළෙඳපොළ සමතුලිතය සුවිශේෂී වන්නේ,
i. එය සත්‍ය මිලදී ගැනීම හා සත්‍ය අලෙවි ප්‍රමාණය සමාන වන අවස්ථාව බැවිනි.
ii. එය දිගුකලක් පැවතිය හැකි මිලක් බැවිනි.
iii. අධි ඉල්ලුමක් හෝ අධි සැපයුමක් නැති එකම මිල බැවිනි.
iv. කර්මාන්තයක උපරිම නිෂ්පාදනය එය බැවිනි.
v. උපරිම මිලදී ගැනීම එය බැවිනි.

09. නිපදවා ඇති භාණ්ඩයක් සඳහා පාරිභෝගිකයකු මිලක් නොගෙවන්නේ නම්,
i. අසීමිතව එම භාණ්ඩ පරිභරණය කළ හැකිවේ.
ii. එම භාණ්ඩ නිපදවීමෙහි ආවස්ථික පිරිවැයක් නැත.
iii. ලබාගැනීමට පාරිභෝගිකයන් අතර විශාල තරගයක් නිර්මාණය වේ.
iv. පාරිභෝගික අතිරික්තය උපරිම වේ.
v. සලාක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සිදුවේ.

10. Qd - 20p මගින් දැක්වෙන භාණ්ඩයක ඇත්තේ,
i. අනම්‍ය ඉල්ලුමකි ii. අසාමාන්‍ය ඉල්ලුමකි iii. නම්‍ය ඉල්ලුමකි
iv. පූර්ණ අනම්‍ය ඉල්ලුමකි v. පූර්ණ නම්‍ය ඉල්ලුමකි

11. X හා Y භාණ්ඩ අතර, හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය -0.5 කි. X භාණ්ඩයේ මිල වැඩිවීමක් මගින්,
i. Y භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.
ii. X භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.
iii. Y භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරයි.
iv. X භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය දකුණට එතැන්වේ.
v. Y භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ.

12. භාණ්ඩයක් සඳහා වූ ආදායම් ඉල්ලුම් නම්‍යතාව 0.25 කි. එම භාණ්ඩය,
i. සුඛෝපභෝගී භාණ්ඩයකි. ii. බාල භාණ්ඩයකි iii. අත්‍යවශ්‍ය භාණ්ඩයකි
iv. නම්‍ය ඉල්ලුමක් ඇති භාණ්ඩයකි v. ගිෆන් භාණ්ඩයකි

13. එක්තරා භාණ්ඩයක් සඳහා වූ සැපයුම් ශ්‍රිතය QS = -20 + 4p මගින් දැක්වෙන බවත් සමතුලිත මිල රු 10/= ක් වන බවත් සිතන්න. සමතුලිතියේදී මෙම භාණඩයේ නිෂ්පාදන අතිරික්තය,
i. රු 25 ii. රු 50 iii. රු 75
iv. රු 100 v. රු 12.50

14. භාණ්ඩයක මිල වැඩි වනවිට පාරිභෝගිකයා භාණ්ඩය ඉල්ලුම් කරන ලද ප්‍රමාණය වැඩි වූයේ නම් හා මිල අඩුවන විට ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු වූයේ නම් එම භාණඩය විස්තර කළහැක්කේ,
i. බාල භාණ්ඩයක් ලෙසය
ii. අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙසය
iii. සාමාන්‍ය භාණ්ඩයක් ලෙසය
iv. සුඛෝපභෝගී භාණ්ඩයක් ලෙසය.
v. නම්‍ය භාණ්ඩයක් ලෙසය.

15. කිසියම් භාණ්ඩයක් වෙළෙඳපොළ සමතුලිතතාවයේ පවතියයි සලකන්න. එම භාණ්ඩයේ ඉල්ලුම් අඩුවෙමින් තිබියදී සැපයුම වැඩි වුවහොත්,
i. මිල හා ප්‍රමාණය වැඩිවේ
ii. මිල ඉහළ නගී ප්‍රමාණය වෙනස පැහැදිලි නැත.
iii. මිල අඩුවේ. ප්‍රමාණයේ වෙනස්වීම් පැහැදිලි නැත.
iv. ප්‍රමාණය අඩුවේ. මිලෙහි වෙනස පැහැදිලි නැත.
v. මිලෙහි හෝ ප්‍රමානයහි වෙනසක් සිදු නොවේ.

16. නිෂ්පාදන අතිරික්තය ශූන්‍ය අගයක් ගැනිමට අවශ්‍ය කරන කොන්දේසි වන්නේ,
i. ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවයෙන් යුක්ත වීමය.
ii. සැපයුම පූර්ණ මිල අනම්‍යතාවයෙන් යුක්ත වීමයි.
iii. සැපයුම පූර්ණ මිල නම්‍යතාවයෙන් යුක්ත වීමයි.
iv. ඉල්ලුමේ නම්‍යතාව සාපේක්ෂ වශයෙන් සැපයුමේ නම්‍යතාවයට වඩා ඉහළ අගයක් ගැනිමයි.
v. ඉල්ලුමේ නම්‍යතාව සාපේක්ෂ වශයෙන් සැපයුමේ නම්‍යතාවට වඩා අඩු අගයක් ගැනිමයි.

17. නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වනවිට,
i. ශ්‍රමයේ ආන්තික ඵලදාව උපරිම වේ.
ii. සාමාන්‍ය මුළු පිරිවැය අවම අගයක් ගනී.
iii. ශ්‍රමයේ මුළු ඵලදාව උපරිම වේ.
iv. ශ්‍රමයේ ආන්ත්‍රික ඵලාව ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාවට සමාන වේ.
v. නිෂ්පාදනයේ ආන්තික ඵලදාව ශූන්‍ය වේ.

18. ගිණුම්කරණ ලාභය හා ආර්ථික ලාභය යන දෙකම එකම අගයක් ගතහැකි අවස්ථාවක් වන්නේ,
i. තමන්ගේම සම්පත් නිෂ්පාදන කාර්යයේ වැඩි වශයෙන් යෙදවීමෙනි.
ii. පිටතින් ගත් යෙදවුම් වැඩි වශයෙන් භාවිත කිරීමෙනි.
iii. පිටතින් ගත් යෙදවුම් හා තමන්ගේ සම්පත් නිෂ්පාදන කාර්යයට සමානව යොදා ගැනීමෙනි.
iv. තම ශ්‍රමය පමණක් නිෂ්පාදන කාර්යයට දායක කිරීමෙනි.
v. පිටතින් ගත් යෙදවුම් පමණක් මත නිෂ්පාදන කටයුතු සිදුවීමෙනි.

19. යෙදවුමක ආන්තික ඵලදාව ශූන්‍ය වනවිට,
i. මුළු ඵලදාව පහළ වැටේ
ii. සාමාන්‍ය ඵලදාව අඩුවීමට පටන් ගනී
iii. සාමාන්‍ය ඵලදාව වැඩිවීමට පටන් ගනී.
iv. මුළු ඵලදාව ඉහළයාම ආරම්භ වේ.
v. මුළු ඵලදාව උපරිම ආගයකට පත්වේ.

20. කිසියම් නිෂ්පාදන ආයතනයක දීගුකාලයේදී ශ්‍රමිකයන් 1200 ක් සේවයේ යොදවා ඇති විටක මුළු නිමැවුම 6000 ක් වූ අතර. ශ්‍රමිකයන් 1600 ක් සේවයේ යෙදවීමිදී මුළු ඵලදාව 8000 ක් දක්වා වැඩිවූයේ නම්,
i. ආයතනය වැඩිවන පරිමාණනුකූල අන්තර ගනී.
ii. හිනවන ආන්තික ඵල අත්කර ගනී.
iii. ආයතනය නිෂ්පාදන පිරිමැසුම් අත් කරගනී.
iv. ආයතනය ස්ථාවර පරිමාණුකූල ල අත් කරගනී.
v. ඵලදාමෙහි හටගන්නා වෙනස නිශ්චය කළ නොහැක.

21. අනුගාමී වර්ෂ දෙකක දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු පහත පරිදි විය. පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු.මි 9800 ක් වූ අතර ප්‍රවර්තන වර්ෂයේ නාමික දළ දේශීය නිෂ්පාදිතය 12500 දක්වා වැඩි තිබුණි. ගම්‍ය මිල දර්ශකය 125 ක් ලෙස සටහන් විය. දළ වශයෙන් වසර 2 ක තුළ ආර්ථික වර්ධන අනුපාතය,
i. 24% ii. 4% iii. 7% iv. 2% v. 5%

22. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි කොටසක් නොවන්නේ,
   i. වගා කිරීම, නැවත වගා කිරීම හා ඉඩම් සංවර්ධනයයි.
   ii. තොග වෙනසයි.
   iii. නැනිම් හා ඉදිකිරීම්
   iv. යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ
   v. ඉඩමක් මිලදී ගැනීමයි

23. සාමාන්‍ය පරිභෝජන නැමියාව (APC) හා ආන්තික පරිභෝජන නැමියාව (MPC) එකම අගයක පවතී නම් එම ආර්ථිකයේ,
   i. ස්වායත්ත පරිභෝජන වියදමක් නොපැවතිය යුතුය.
   ii. වියදම් වැඩි කළද නිමැවුමේ ඉහළ යාමක් නොවිය යුතුය.
   iii. බදු පනවා යළි ඒවා ආණ්ඩුවේ වියදම් ලෙස පවත්වා ගත යුතුය.
   iv. සමාහාර වියදම සමාහාර ආදායමට සමාජ විය යුතුය.
   v. ගිලිහීම්, විදීම් වලට සමාන විය යුතුය.

24. කිසියම් ආර්ථිකයක තිරණය වූ සමතුලිත ආදායම තවදුරටත් නොවෙනස්ව පවත්වා ගතහැකි ක්‍රියාකාරකම් හඳුනාගන්න.
   i. රු.මි. 100 ක් බදු එය සංක්‍රාම වියදම් ලෙස පවත්වා ගැනීම.
   ii. රු.මි. 100 ක් බදු පනවා එය සංක්‍රාම වියදම් ලෙස පවත්වා ගැනීම.
   iii. රු.මි.100 ක බදු නිදහස් කොට රු.මි. 100 කින් සංක්‍රාම වියදම් වැඩි කිරීමයි.
   iv. රු.මි. 100 ක් බදු පනවා රු.මි. 200 ක් ආණ්ඩුවේ වියදම් ලෙස පවත්වා ගැනීමයි.
   v. බදු නොපනවා රජයේ වියදම් සුළු ප්‍රමාණයකින් වැඩි කිරීමයි.

25. රටක ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟ ශේෂයක් වාර්තා වුවද එය අභිබවා යාමට සමත් ද්විතියික ආදායම් ගිණුමේ ධන ශේෂයක් වාර්තා වුයේ නම්, එරට
   i. දළ දේශීය වියදම දළ ජාතික නිෂ්පාදිතයට වඩා වැඩිය.
   ii. ගෙවුම් තුලනයේ වර්තන ගිණුමේ අතිරික්තයක් වාර්තා වේ.
   iii. දළ දේශීය නිෂ්පාදිතියට වඩා දළ ජාතික නිෂ්පාදිතය වැඩිය.
   iv. දළ ජාතික නිෂ්පාදිතයට වඩා වැය කළහැකි දළ ජාතික ආදායාම වැඩිය.
   v. ගෙවුම් තුලනයේ වර්තන ගිණුමේ හිඟයක් පවතී.

26. රටක බදු ගුණකය -4 ක් වුයේ නම්,

	ආන්තික පරිභෝජන නැමියාව	ආන්තික ඉතුරුම් නැමියාව	ස්වාධීන වියදම් ගුණකය	සංග්‍රාම වියදම් ගුණකය
1	0.6	0.4	4	5
2	0.8	0.2	5	4
3	0.9	0.1	-4	-4
4	0.5	0.5	5	4
5	0.7	0.3	-5	-5

27. එක්තරා වර්ෂයක ශුද්ධ අපනයන ඍණ ශේෂයක් වාර්තා වුයේ නම් එරට,
   i. අනිවාර්යයෙන්ම ගෙවුම් තුලනයේ වර්තන ගිණුමේ ඍණ ශේෂයක් වාර්තා විය යුතුය.
   ii. දළ දේශීය වියදම දළ දේශීය නිෂ්පාදිතයට වඩා වැඩිය.
   iii. දළ දේශීය වියදම දළ දේශීය නිෂ්පාදිතයට වඩා අඩුය.
   iv. භාණ්ඩ හා සේවා ගිණුම වාසිදායක ශේෂයක් විය.
   v. වෙළඳ ගිණුම ඍණ ශේෂයක් වීම අනිවාර්යය.

28. 10% ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයට යටත්ව ක්‍රියාකාරන වාණිජ බැංකු පද්ධතියක ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

වගකීම්		වත්කම්	
ඉල්ලුම් තැන්පතු	1000	සංචිත	120
කොටස් ප්‍රාග්ධනය	500	සුරැකුම්පත් වල ආයෝජන	380
		ණය	1000
	1500		1500

මෙම තත්වය තුල නිගමනය කළ හැක්කේ,

i. තවදුරටත් එම බැංකු පද්ධතියට ණය දිය නොහැකි බවයි.
ii. බැංකු පද්ධතියෙහි අධි සංචිතය -30 ක් බවයි.
iii. තැන්පතු ගුණකයෙන් මැවීමට නිර්දේශිත උපරිම ණය සපයා නොමැති බවයි.
iv. පවත්වා ගත යුතු සංචිතය 150 ක් විය යුතු බවයි.
v. දී ඇති ණය 300 ක් ආපසු කැඳවිය යුතු බවයි.

29. ඉහත බැංකු පද්ධතියෙහි ණය සඳහා ගැලපීම් කළහොත් අළුත් අගයන් විය යුත්තේ,

	ඉල්ලුම් තැන්පතු	ණය	සංචිත
1	700	700	70
2	1300	1000	130
3	1200	1200	120
4	1200	800	120
5	500	1500	150

30. මුදලේ සංසරණ ප්‍රවේගයේ අඩුවීමක් සිදු වුවද, නාමික දළ දේශිය නිෂ්පාදිතයේ වෙනසක් සිදු නොවුයේ නම්

i. මිල මට්ටමෙහි අඩුවීමක් සිදු වී ඇත.
ii. මිල මට්ටම හා අවසන් ගනුදෙනු සංඛ්‍යාවෙහි වැඩිවීමක් සිදුවී ඇත.
iii. මුදල් සැපයුමෙහි අඩුවීමක් සිදුවී ඇත.
iv. උද්ධමනය අඩුවී ඇත.
v. මුදල් සැපයුමෙහි වර්ධනයක් සිදුවී ඇත.

31. මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා අරමුණ සමඟ සම්බන්ධ වන කාර්යයන් දැක්වෙන වරණය තෝරන්න.

i. මුල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම, විනිමය අනුපාතික ප්‍රතිපත්තිය.
ii. මුල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම, වාණිජ බැංකු කටයුතු නිෂ්කාශණය
iii. විනිමය අනුපාත ප්‍රතිපත්තිය, රජයේ බැංකු කරුවා ලෙස ක්‍රියාකිරීම.
iv. විනිමය පාලනය, වාණිජ බැංකුවල ගිණුම් පවත්වාගෙන යාම.
v. ව්‍යවහාර මුදල් නිකුතුව, වාණිජ බැංකුවල ගිණුම් පවත්වාගෙන යාම.

32. රටක උද්ධමනයක්, සේවා වියුක්තියක් එකවර ඉහළ අගයක පවති නම්,

i. අපනයන ආදායම පෙරට වඩා වැඩිවනු ඇත.
ii. දුක්ඛිත භාවය ඉහළ යනු ඇත.
iii. ආනයන වලට වැඩි නැඹුරුවක් පවත්වා ගනී.
iv. මූර්ත නිෂ්පාදනයෙහි වැඩිවීමක් සිදුවනු ඇත.
v. ආදායම් ප්‍රතිව්‍යාප්තියක් ඇතිවේ.

33. රජය අයවැය හිඟයක් මගින් සැමවිටම,
   i. උද්මමනයක් ඇතිවේ.
   ii. ආර්ථික කටයුතු පසු බෑමකට ලක්වේ.
   iii. පුනරාවර්තන වියදම් වැඩිවේ.
   iv. තෙරපුම් ප්‍රතිවිපාකයක් ඇති කරයි.
   v. ජනතාවගේ සුබ සාධනය අඩුවේ.

34. එකඟ නොවන ප්‍රකාශය තෝරන්න.
   i. අතුරු අයවැය යනු අතුරු සම්මත ගිණුමකි.
   ii. රාජ්‍ය අයවැය ලෙස දැක්වෙන්නේ විසර්ජන පනතයි.
   iii. රාජ්‍ය ඉතුරුම් යනු වර්තන ගිණුමේ අතිරික්තයයි.
   iv. වර්තන වියදම් වැඩි වුවහොත් අනිවාර්යෙන්ම ප්‍රාග්ධන වියදම් අඩු කිරීමට සිදු නොවේ..
   v. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමෙන් වැඩි කොටසක් වක්‍ර බදුය.

35. බදු සම්බන්ධයෙන් ඉදිරිපත් කළහැකි නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   i. දුම්කොල හා මත්පැන් මත අය කෙරෙන බදු සමානුපාතික බදුය.
   ii. VAT බද්ද ප්‍රතික්‍රමික බද්දකි.
   iii. බදු පදනම මගින් පෙන්නුම් කරන්න් බදු මුලධර්මයි.
   iv. ආදායම් බදු ප්‍රතික්‍රම වේ.
   v. අධි බදු බර වැලකෙන බදු ක්‍රමයක මධ්‍යස්ථ බව රැකේ.

පහත දැක්වෙන ප්‍රස්ථාර සටහන ඔස්සේ 36 හා 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A, A_1 මගින් ඉන්දියාවේ නිෂ්පාදන හැකියාවද
B, B_1 මගින් චීනයේ නිෂ්පාදන හැකියාවද නිරූපණය කෙරෙන බව සිතන්න.

36. i. සහල් වල නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය ඇත්තේ චීනයටයි.
   ii. තිරිඟු සහ සහල් සඳහා නිර්පේක්ෂ වාසි ඉන්නදියාවටයි.
   iii. ඉන්දියාවට තිරිඟු සඳහා සාපෙක්ෂ වාසි පවතින අතර. නිරපේක්ෂ වාසිය ඇත්තේ සහල් සඳහාය.
   iv. ඉන්දියාව සහල් අපනයන කළයුතු අතර චීනය තිරිඟු අපනයනය කළයුතුය.
   v. විදේශ වෙළදාමට පිවිසීමෙන් කිසිදු රටකට වාසි සිදු නොවේ.

37. i. සහල් ඒකකයක් සඳහා ඉන්දියාව තිරිඟු ඒකකයක් කැප කළ යුතුය.
   ii. සහල් ඒකකයක් සඳහා චීනය තිරිඟු ඒකක 0.5 ක් කැප කලයුතුය
   iii. වාසිදායක වෙළදාමකදී සහල් ඒකකයක් සඳහා තිරිඟු 0.5 ට වැඩි හා 2.0 ට අඩු ප්‍රමාණයක් හුවමාරු වේ.
   iv. වාසිදායක වෙළදාමකදී තිරිඟු ඒකකයක් සඳහා සහල් ක් හුවමාරු වේ.
   v. ඉන්දියාවට තිරිඟු සහ සහල් සහ භාණ්ඩ 2 ටම සාපේක්ෂ වාසි අත් කර දේ

38. සාවද්‍ය පිළිතුර තෝරන්න.
   i. වෙළඳ අනුපාතය යහපත් වනවිට අපනයන මිල දර්ශකය ආනයන මිල දර්ශකයට සාපේක්ෂව ඉහළ අගයකි.
   ii. භාණ්ඩ හා සේවා අපනයන, ආනයන වල වෙනස ශුද්ධ අපනයන වේ.
   iii. වෙළෙඳ අනුපාතය යහපත් නම් ආදායම් වෙළඳ අනුපතයද යහපත්ය.
   iv. විදේශ වෙළඳාමට පිවිසීමෙන් රටකට වාසි අත්වේ.
   v. විදේශ වෙළඳාමෙන් හැමවිටම රටකට වාසි අත් කර නොදේ.

39. විනිමය අනුපාතය පිළිබඳ වඩාත් නිවැරදි නිගමනය වන්නේ,
   i. විනිමය ක්ෂයවීම හා අව ප්‍රමාණය කිරීම අතර වෙනසක් නැත.
   ii. විශේෂ ගැනුම් හිමිකම් (S.D.R) යනු මුදල් වර්ග 5ක බර තැබූ සාමාන්‍ය අගයයි.
   iii. විනිමය ක්ෂය වීමේදී විනිමය ක්ෂය වූ රටේ භාණ්ඩයක් විදේශිකයන්ට මිල අඩුවන අතර, විදේශ ආනයන භාණ්ඩයක මිල ඉහළ යනු ඇත.
   iv. විනිමය ක්ෂය වීමක් හැමවිටම විදේශ වෙළඳාමට අහිතකරය.
   v. විනිමය සඳහා පවතින ඉල්ලුම් මත විනිමය අගය තීරණය වේ.

40. යම් තෝරගන්නා ලද භාණ්ඩ පැසක් සඳහා ඇමරිකාවේදී ගෙවීමට සිදුවන මිල ඩොලර් 200 කි. එම භාණ්ඩ පැස ශ්‍රී ලංකාවේදී රු 10,000 ක් නම් නිගමනය කළහැක්කේ,
   i. රුපියලේ බාහිර අගය 20% කින් අධි තක්සේරු වී ඇති බවයි.
   ii. රුපියලේ බාහිර අගය 20% කින් ඌන තක්සේරු වී ඇති බවයි.
   iii. ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය ඩොලරයට රු 100 ක් බවයි.
   iv. ක්‍රය ශක්ති සමා විනිමය අනුපාතිකය රුපියලකට ඩොලර් 0.50 ක් බවයි.
   v. ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය ඩොලරයකට රු 50 ක් බවයි.

41. රටක මුළු ජනගහනය මිලියන 25 කි. වයස අවු 0 - 14 ක් අතර ජන සංඛ්‍යාව මිලියන 5 කි. සේවා නියුක්ත ජන සංඛ්‍යාව මිලියන 10 ක් හා සේවා වියුක්ත ජන සංඛ්‍යාව මිලියන 5 කි. මෙම තොරතුරු වලට අදාල වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

සේවා නියුක්ත අනුපාතය	ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය
1) 60.6%	90%
2) 70%	85%
3) 66.6%	75%
4) 75.5%	70%
5) 80%	65%

42. සාවද්‍ය පිළිතුර තෝරන්න.
   i. ශ්‍රී ලංකාවේ කාන්තා සේවා වියුක්තියට වඩා පුරුෂ සේවා වියුක්තිය වැඩිය.
   ii. ශ්‍රී ලංකාවේ වැඩි සේවා වියුක්තිය ඇත්තේ උගතුන් අතරය.
   iii. ශ්‍රී ලංකාවේ නාගරික අංශයේ සේවා වියුක්තිය ග්‍රාමීය සේවා වියුක්තියට වැඩිය.
   iv. ශ්‍රී ලංකාවේ තරුණ පිරිස අතර වැඩිම සේවා වියුක්තියක් ඇත.
   v. ශ්‍රී ලංකාවේ අඩුම සේවා වියුක්තියක් ඇත්තේ අඩු අධ්‍යාපනයක් ලත් පිරිස අතරය.

43. සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයක් නොවන්නේ,
   i. සැමට ප්‍රාථමික අධ්‍යාපනය
   ii. අන්ත දුගී භාවය හා කුසගින්න පිටු දැකිම.
   iii. යහපාලනය
   iv. කාන්තාව සවිබල ගැන්වීම.
   v. ඒඩ්ස්/මැලේරියා වැනි වසංගත රෝග පිටු දැකීම.

44. ෂඩ් බල කේන්ද්‍රය දැක්වෙන පිළිතුර තෝරන්න.
   i. යුධ, ගුවන්, නාවික, තාක්ෂණ, වාණිජ, සංචාරක
   ii. ගුවන්, නාවික, බලශක්ති, වාණිජ, දැනුම, සංචාරක
   iii. යුධ, ගුවන්, ආරක්ෂක, තාක්ෂණ, වාණිජ, නාවික
   iv. යුධ, ගුවන්, නාවික, ආරක්ෂක, බලශක්ති, වාණිජ
   v. මහාමාර්ග, දුම්රිය මාර්ග, වරාය, ගුවන්, නාවික, බලශක්ති

45. ලෝරන්ස් වක්‍රය හා ගිනි සංගුණකය රටක,
i. නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය පිළිඹිබු කරන මිනුමකි.
ii. ආර්ථික හැකියාව පිළිඹිබු කරන මිනුමකි.
iii. සාපේක්ෂ දුගී බව පිළිබඳ මිනුමකි.
iv. සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය පිළිබඳ මිනුමකි.
v. තිරසාර සංවර්ධනය පිළිබඳ මිනුමකි.

46. තිරසාර සංවර්ධනය මගින් විග්‍රහ නොකෙරෙන්නේ,
i. ආර්ථික, සමාජ හා පාරිසරික පැතිකඩයි.
ii. ධරණීය සංවර්ධනයයි.
iii. ආදායම් ව්‍යාප්තියේ අසමානතාවයයි.
iv. තුලිත සංවර්ධනයයි.
v. සංවර්ධනය වඩාත් අර්ථ දැක්වීමයි.

47. දිළිඳු ජනයාගේ සුභ සිද්ධිය මුල් කරගත් වැඩ සටහනක් නොවන්නේ,
i. සමෘද්ධිය ii. ජන සවිය iii. ක්ෂුද්‍ර මූල්‍ය ණය iv. ගැමි දිරි
v. රන්දොර

48. 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය, සේවා වියුක්ති අනුපාතය උද්ධමන අනුපාතය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

	ආර්ථික වර්ධන අනුපාතය	සේවා වියුක්ති අනුපාතය	උද්ධමන අනුපාතය
1	7.4	4.3	7.0
2	7.4	4.3	3.3
3	7.2	5.4	3.3
4	6.4	4.0	7.6
5	8.2	4.0	7.0

49. ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමය මැද පෙරදිගට සංක්‍රමණය වීමේදී විශේෂයෙන් සැලකිල්ලට ගතයුතු බවට රජය විසින් මෑතකදී ගනු ලැබූ ප්‍රතිපත්ති තීරණය වන්නේ,
i. අවම වයස් සීමාව තීරණය කිරීම හා පවුල් පසුබිම පිළිබඳ වාර්තා ලබාගැනීම.
ii. සේවය කළහැකි උපරිම සේවා කාලය තීරණය කිරීම.
iii. නිශ්චල හෝ චංචල දේපලක් ඇපයට තැබීම.
iv. වසර 2 කට වරක් සේවා දිගුවක් ලබාගැනීම.
v. වෛද්‍ය වාර්තා නිසි ලෙස නඩත්තු කිරීමට හාම්පුතුන්ට බලකිරීම.

50. 2014 සඳහා ශ්‍රී ලංකාවේ ආංගික සේවා නියුක්තිය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

	කෘෂි අංශය	කර්මාන්ත අංශය	සේවා අංශය
1	27%	24%	49%
2	24.5%	26.5%	49%
3	45.0%	26.5%	28.5%
4	26.5%	30.5%	43%
5	28.5%	26.5%	45%

100

ඩී.එස්.සේනානායක විද්‍යාලය, කොළඹ - 07.

අ.පො.ස (උ.පෙළ) විභාගය - 2016 පූර්ව පරීක්ෂණය

ආර්ථික විද්‍යාව

11 පත්‍රය

කාලය පැය 03

"අ" උප කොටසින් ප්‍රශ්න 2 ක් හා ආ උප කොටසින් ප්‍රශ්න 2ක් බැගින් තෝරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

"අ" උප කොටස

01. i. දිනෙන් දින ඉහළ යන ජනගහනය හමුවේ මිනිස් සමාජයට භාණ්ඩ හා සේවා අතර තේරීමේ පරාසය අඩු කරනු ඇත. එකඟ ද ? හේතු දක්වන්න.

(ලකුණු 04)

ii. පහත දැක්වෙන දෑ පිළිබඳ කෙටි සටහන් සපයන්න.

අ) ආර්ථික භාණ්ඩ ආ) නිව භාණ්ඩ ඇ) පාරිභෝගික භාණ්ඩ

ඈ) අන්තර් භාණ්ඩ

(ලකුණු 04)

iii. විකල්ප හඳුන්වා දීමිද සහිතව මූලික ආර්ථික ගැටළු හඳුන්වන්න.

(ලකුණු 03)

iv. ආර්ථික පද්ධතිවල දක්නට ලැබෙන ආයතනික ලක්ෂණ තුල අනිවාර්යයෙන් පැවතිය යුතු කරුණු දක්වා ධනේශ්වර හා සමාජවාදී වශයෙන් ආර්ථිකයන් වර්ගීකරණයකට ඒවා පාදක කරගත හැකි දැයි විචාරාත්මකව විමසන්න.

(ලකුණු 05)

v. සීමිත නිමැවුම අසීමිත ඉල්ලුම් කරුවන් අතර බෙදා හැරීම සඳහා මිල ක්‍රමයට විකල්ප ක්‍රම කවරේද ?

(ලකුණු 04)

02. i. "නිමැවුම් පරතරය" නිෂ්පාදන හැකියාව මායිම් වක්‍රයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. පහත සඳහන් දෑ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ඇසුරින් පැහැදිලි කරන්න.

අ) සම්පත් අවභාවිතය

ආ) සම්පත් වල ඵලදායිතාවය පහත වැටීම.

ඇ) ගංවතුරින් කෘෂි වගාවට හානි පැමිණීම

ඈ) මානව ප්‍රාග්ධන සංවර්ධනයට විදේශ අරමුදල් ගලා ඒම

(ලකුණු 04)

iii. ආර්ථිකයක පවතින සියළුම සම්පත් උපරිම කාර්යක්ෂමතාවෙන් පවතින තාක්ෂණය යටතේ භාවිත කළ විට X භාණ්ඩ 200 නිපදවිය හැක. X භාණ්ඩ නිමැවුම අඩු කරන සෑම ඒකක 2 ක් සඳහා Y භාන්ඩ ඒකකයක් බැගින් නිමැවුම ඉහළ යයි.

අ. මෙම තොරතුරු පදනම් කරගෙන ආදළ නිෂ්පාදන හැකියා මායිමක් වක්‍රයක් ගොඩ නගන්න.

(ලකුණු 02)

ආ. ඔබ ඇඳි නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ආවස්ථික පිරිවැය පිළිබඳව ඔබ පැහැදිලි කරන්නේ කෙසේද ?

(ලකුණු 02)

iv. සම්පත්වල ඵලදායිතාවයක් තරගකාරිත්වයක් ඉහළ නැංවීම සඳහා ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණය හේතුවේ. එකඟද හේතු දක්වන්න.

(ලකුණු 05)

v. ප්‍රාග්ධනය තොග සංකල්පයකි. පැහැදිලි කරන්න.

(ලකුණු 03)

03. භාණ්ඩයක මිල රු 5 දී සැපයුම් ප්‍රමාණය 200 ක් වන අතර අධි ඉල්ලුම් ප්‍රමාණය 300 කි. මිල රු 10 ක් වනවිට සැපයුම 300 ක් වන අතර අධි සැපයුම 300 කි.

i. ඉහත තොරතුරු පදනම් කරගෙන ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩ නගා සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

ii. ඉහත භාණ්ඩයේ සෑම මිලකදීම ඉලල්ම් ප්‍රමාණය ඒකක 200 කින් අඩුවන අතර, සැපයුම් ප්‍රමාණය ඒකක 100 කින් ඉහළ යන බව සිතන්න.

(ලකුණු 02)

අ. භාණ්ඩයේ නව සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණද ?

(ලකුණු 02)

ආ. අවස්ථා දෙක තුළ පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයේ හටගත් වෙනස්කම් දක්වන්න.

(ලකුණු 02)

iii. නිදහස් වෙළඳපොළ සමතුලිතයක් ප්‍රශස්ත එකක් වීමට ඉටුවිය යුතු කොන්දේසිය දක්වා වෙළඳපොළ පාර්ශවයන්ට එහි කවර බලපෑමක් ඇති කිරීමට සමත්ද යන්න දක්වන්න.

(ලකුණු 03)

iv. භාණ්ඩයක මිල වෙනස්වීම අයබාරය/පැහැදම කෙරෙහි ඇති කරන බලපෑම ඉල්ලුම් ණම්‍යතාවයන් ඔස්සේ හඳුන්වන්න.

(ලකුණු 03)

v. ඉල්ලුමේ හා සැපයුමේ ඒකීය නම්‍ය, අනම්‍ය හා නම්‍ය අවස්ථාවන්හි අලෙවි බද්දක් පැනවීමේදි බදු බර බෙදී යන අයුරු පෙන්වන්න.

(ලකුණු 03)

vi. වෙළඳපළ පිළිබඳ පූර්ණ දැනුමක් නොමැති විට පාරිභෝගික ස්වාධිපත්‍ය ගිලිහේ. පහදන්න.

(ලකුණු 03)

04. i. භාණ්ඩයකට ඇති ඉල්ලුම නිෂ්පාදන සාධකවලට පවතින ඉල්ලුමෙන් වෙනස් වේ. පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. සාධකවල සංක්‍රාම ඉපයීම් හා ආර්ථික බදු කුලිය යන්න රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. මුළු ඵලදාම, සාමාන්‍ය ඵලදාව හා ආන්තික ඵලදාව යන්න පැහැදිලි කොට ඒවායේ හැසිරීම උචිත ප්‍රස්ථාරයක් යොදාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. ආන්තික අයභාරය (MR) හා සාමාන්‍ය අයභාරය (AR) දිගටම නොවෙනස්ව පවතින වෙළඳ පොළ ව්‍යුහය හඳුනාගෙන එහි සුවිශේෂී ලක්ෂණ සඳහන් කරන්න.

(ලකුණු 03)

v. කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය ලියා දක්වා කෙටිකාලයේදී සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැඩය හා ඊට බලපාන නීතිය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

05. එක්තරා කල්පිත ආර්ථිකයක ස්වායත්ත වියදම් වල එකතුව රු.බි. 1200 කි. බදු අය නොකරන මෙම ආර්ථිකයේ කුටුම්භ තමන්ට ආදායමක් නැතත් රු.බි. 200 ක වියදමක් පවත්වා ගන්නා අතර, වෙනස්වන ආදායමෙන් 20% ක් පරිභෝජනයට නොයොදා ඉතිරි කරගනී.

1. ඉහත තොරතුරු ඇසුරින් පරිභෝජන හා ඉතුරුම් ශ්‍රිත ගොඩ නගන්න.
(ලකුණු 04)

2. සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.
(ලකුණු 02)

3. ඉහත ආර්ථිකයට තවදුරටත් රජය මැදිහත් වී සියළු ආදායම් මත 10% ක බදු පනවා රු.බි. 600 ක සංක්‍රාම වියදමක් පවත්වා ගන්නා බව සිතන්න.
   i. නව සමතුලිත ජාතික ආදායම කොපමණද ?
   (ලකුණු 02)
   ii. ආදායමෙහි වෙනසක් හට ගත්තේද ? නැද්ද යන්න මැදිහත් වීමට අදාළ ගුණක ඔස්සේ විභාග කරන්න.
   (ලකුණු 04)

05. i. ජාතික ආදායමේ චක්‍රිය ප්‍රවාහ සංකල්පය තුල ප්‍රවාහය හැකිලීමට ඉවහල් වන කාන්දුවීම් හා ප්‍රවාහය ප්‍රසාරණය කිරීමට ඉවහල් වන විදීම් හඳුනා ගනිමින්, ප්‍රවාහයේ අඛණ්ඩ සම්බන්ධතාවය උදෙසා ඒවායේ හැසිරීම පරීක්ෂා කරන්න.
(ලකුණු 04)

ii. ද්විගණනය යනු කුමක්දැයි දක්වා එය වලකාගැනීම සඳහා නිෂ්පාදන ප්‍රවේශයේදී අනුගමනය කරන ක්‍රමවේද තුල එය ඉටුවන ආකාරය කල්පිත උදාහරණයක් ඇසුරින් දක්වන්න.
පහත දැක්වෙන කල්පිත දත්ත ඔස්සේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- වැය කළ හැකි දළ ජාතික නිෂ්පාදිතය = 480
- දළ දේශීය වියදම = 540
- කුම්භ පරිභෝජනය = 300
- ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය = 60
- ප්‍රාථමික ආදායමේ ගිණුමේ ශේෂය = -20
- ආණ්ඩුවේ මිලදී ගැනීම් = 100
- තොග වෙනස = 40

අ. ද.දේ.නි. ආ. ද.ජා.නි. ඇ. ශුද්ධ අපනයන
ඈ. දළදේශීය ප්‍රාග්ධන සම්පාදනය
(ලකුණු 04)

"ආ" උප කොටස

06. i. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමේ කාර්ය මැනවින් ඉටු කරයි. එය එම පද්ධතිය සාර්ථක වීමට හේතුවේ. එහෙත් වත්මන් වෙළෙඳපොළ ආර්ථික පද්ධති අසමත් වීම් පිළිබඳව ද සාකච්ඡා කෙරේ.
   අ. ඉහත දක්වන ලද අන්දමේ සාර්ථක වීමක් පදනම් කරගන්නා කරුණු කවරේද ?
   (ලකුණු 03)
   ආ. අසමත්වීම් හෙවත් අසාර්ථක වීමට හේතුවන කරුණු කවරේද ?
   (ලකුණු 03)

ii. පහත සඳහන් දෑ පිළිබඳව කෙටි සටහන් සපයන්න.
   අ. ගෝලීය පොදු භාණ්ඩ ආ. පොදු සම්පත් ඇ. අර්ධ පොදු භාණ්ඩ
   (ලකුණු 06)

iii. බාහිරතා හඳුන්වා ඒ සඳහා උදාහරණ සපයන්න.
(ලකුණු 04)

iv. ඍණ බාහිරතා සහිත පරිභෝජන ක්‍රියාවලියක් නිසා සම්පත් බෙදියාම අකාර්ක්ෂම වීම හා ධන බාහිරතා සහිත පරිභෝජන ක්‍රියාවලියක් නිසා සම්පත් උපයෝජනය අකාර්යක්ෂම වීම උචිත ඇප සටහන් ඔස්සේ පෙන්වන්න.
(ලකුණු 04)

07. i. පෞද්ගලික කරණයේ සමාජ පිරිවැය ප්‍රතිලාභ කවරේද ? (ලකුණු 04)

ii. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල් කාර්ත්වයන් විවිධ ස්වරූප ගත හැකිය. ඒවා අතුරෙන් වඩාත් සුලභ ස්වරූප 3 ක් දක්වන්න. (ලකුණු 03)

iii. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වල සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති 4 ක් දක්වන්න. (ලකුණු 02)

iv. බදු අයකිරීම මගින් රජයක් අපේක්ෂා කරන අරමුණු දක්වා ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

v. බදු පදනම හඳුන්වා ඒ මත බදු වර්ගීකරණය වන ආකාරය දක්වන්න. (ලකුණු 03)

vi. අතුරු සම්පත ගිණුම හා අතුරු අයවැය අතර වෙනසක් පවතිද ? පැහැදිලි කරන්න. (ලකුණු 04)

08. i. ද්‍රවශීලතාවය හා ද්‍රවශීලතාවරණය යන දෙකෙන්ම අදහස් වන්නේ එකම දෙයකි. එකඟද ? පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. මුදල් සැපයුමක් මිල මට්ටමක් අතර ඇත්තේ සමානුපාතික සම්බන්ධතාවයකි. පැහැදිලි කොට විමසන්න. (ලකුණු 04)

iii. පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පටු මුදල් (M_1) සඳහා ගණිතය = 4
- (M_1) මුදල් සැපයුම = 1000
- ඇති වාසි සතු සල්ලි සංචිතය = 90
- මහජනයා, නමින් වාණිජ බැංකු වල ඇති ඉතුරුම් සහ කාලීන තැන්පතු = 500

අ. පුළුල් මුදල් සඳහා මුදල් ගුණකය (ලකුණු 01)

ආ. 10% ක සංචිත අනුපාතයට යටත්ව ක්‍රියා කරන පද්ධතියේ අධි සංචිත (ලකුණු 01)

ඇ. අධි සංචිත සඳහා ගැලපීම් කළ විට බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය (ලකුණු 02)

ඈ. ණයදීම සම්පූර්ණ වීමෙන් පසු (M_1) මුදල් සැපයුම (ලකුණු 02)

iv. මහ බැංකුවේ අරමුණ හා කාර්යයන් අතර පවතින සම්බන්ධතාවය පෙන්නුම් කරන්න. (ලකුණු 03)

v. ශ්‍රී ලංකාවේ මෑතකාලීන උද්ධමනයේ ස්වභාවය හා ඒ සඳහා බලපෑ හේතු සඳහන් කරන්න. (ලකුණු 04)

09. i. රටවල් අන්තර් ජාතික වෙළඳාමට අවතීර්ණ වීමට හේතුවන ප්‍රධාන කරුණු 3 කවරේද ? (ලකුණු 03)

ii. ඔබගේම සංඛ්‍යා යොදා ගනිමින් නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි හඳුනාගන්න. (ලකුණු 04)

iii. සාපේක්ෂ වාසි හඳුනා ගැනීමෙන් දෙරට අතර වාසිදායක වෙළඳාමකදී හුවමාරු අනුපාතය ප්‍රකාශ කරන්න. (ලකුණු 02)

iv. වාසිදායක වෙළඳ අනුපාතයක් පවති නම් වෙළෙඳ ශේෂය අවශ්‍යයෙන්ම යහපත් වේ. එකඟද හේතු දක්වන්න. (ලකුණු 03)

v. නිදහස් වෙළඳාමක ඇති කෙරෙන බාධක අතර තිරු බදු නොවන වෙළඳ බාධක කවරේද ? (ලකුණු 04)

vi. නාමික විනිමය අනුපාතය හා සචල විනමය අනුපාතය අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

10. i. නව ගෙවුම් ශේෂ ආකෘතියක ප්‍රාථමික ආදායම් ගිණුම හා ද්විතියික ආදායම් ගිණුමෙන් ඇතුළත් කෙරෙන තොරතුරු කවරේද ? (ලකුණු 02)

ii. විනිමය ආවප්‍රමාණය කිරීමක් වෙළෙඳ ගිණුමට හිතකර බලපෑමක් ඇති කරනනේද ? යන්න විචාරාත්මකව විමසන්න. (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වෙමින් සිටින බවට ඉදිරිපත් කළහැකි තර්ක කවරේද ? (ලකුණු 03)

iv. ඌන සේවා නියුක්තිය අර්ථ දක්වා ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ විශේෂ ලක්ෂණ ද හඳුනාගන්න. (ලකුණු 04)

v. මිල ස්ථායිතාවය පවත්වා ගැනිම සාර්ව ආර්ථික අරමුණකි.

අ. මිල ස්ථායිතාවය නිශ්චිත අරුත දක්වන්න. (ලකුණු 01)

ආ. මිල අස්ථායිවීම යනු කුමක්ද ? (ලකුණු 01)

vi. ආර්ථික වෘද්ධියක පිරිවැය කවරේද ? (ලකුණු 02)

v. ශ්‍රී ලංකාවේ දරිද්‍රතා උපනති දක්වා එයට දායක වූ වැඩ සටහන් කවරේදැයි හඳුනාගන්න. (ලකුණු 03)